දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................................

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව
මගේ අංකය / எமது இல. / My No. ED/01/12/02/06/01

දිනය / திகதி / Date 2006.01.12

චක්‍රලේඛ අංකය : 2006/02

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ජාතික පාසල් විදුහල්පතිවරුන්,

## ජාතික පාසල්වල 2 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර) පංතිවලට සිසුන් ඇතුළත් කිරීම

පාසල්වල 2 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා (6 වන ශ්‍රේණිය හැර) වූ පංතිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ විධිවිධානයන් 2004.05.31 දිනැති අංක. 2004/18 දරන චක්‍රලේඛයේ ii කොටසෙහි ඇතුළත් කර ඇත. ජාතික පාසල් සඳහා පමණක් එම චක්‍රලේඛයේ ii කොටසෙහි සඳහන් විධිවිධානයන් අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2006.01.12 වන දින සිට බලපැවැත්වේ. මෙම චක්‍රලේඛ උපදෙස් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බව ද අවධාරනය කරමි.

02. 2 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර) පංතිවල පුරප්පාඩු පිරවීමේ දී පහත දැක්වෙන සිසුන්ට පමණක් පාසල් ලබා දීම කළ යුතුය.

අ). පෞද්ගලික වාසස්ථානයෙන් බැහැරව වාසය කිරීමට සිදු වන පාර්ලිමේන්තුවට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන්

ආ). ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණෙන රජයේ නිලධාරීන්ගේ / සංස්ථා සේවකයන්ගේ / රාජ්‍ය බැංකු නිලධාරීන්ගේ දරුවන්

ඇ). විදේශයන්හි දෙවර්ෂයකට වැඩි කාලයක් මව, පියා හා දරුවා පදිංචිව සිට ආපසු පැමිණෙන ශ්‍රී ලාංකිකයන්ගේ දරුවන්.

ඈ). පාසල පිහිටි ප්‍රදේශයට සැබැවින්ම තම ස්ථිර වාසස්ථානය වෙනස් කර පැමිණි මව්පියන් / නිත්‍යානුකූල භාරකරුවන්ගේ දරුවන්

03. i. 2 වන ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා එක් පංතියක ශිෂ්‍ය සංඛ්‍යාව 40 කට සීමා කළ යුතු අතර දැනටමත් එම පංතිවල සිසුන් සංඛ්‍යාව 40 හෝ 40 ඉක්මවා සිටිත් නම් එම පංතිවලට අලුතින් සිසුන් ඇතුළත් නොකළ යුතුය.

ii. 6 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක් පංතියක ශිෂ්‍ය සංඛ්‍යාව 45 කට සීමා කළ යුතු අතර දැනටමත් එම පංතිවල සිසුන් සංඛ්‍යාව 45 හෝ 45 ඉක්මවා තිබේ නම් එම පංතිවලට අලුතින් සිසුන් ඇතුළත් නොකළ යුතුය.

04. ජාතික පාසලක පංතියක/පංතිවල පුරප්පාඩු පවතින්නේ නම්, පාසල විසින් තමන්ට ලැබී ඇති ඉල්ලුම් පත් ඉදිරිපත් කළ අයගෙන් සුදුස්සන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ගත යුතුය. එම සම්මුඛ පරීක්ෂණයේ දී මෙයට අමුණා ඇති උප ලේඛණයේ පරිදි ඒ ඒ අයදුම්කරුවන් විසින් ලබා ගන්නා ලකුණු අනුව ප්‍රමුඛතා ලේඛණයක් සකස් කළ යුතුයි.

05. ඉහත 4 හි සඳහන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පහත සඳහන් අයුරින් සකස් විය යුතුය.

i. විදුහල්පති
ii. නියෝජ්‍ය විදුහල්පති
iii. අදාළ අංශ ප්‍රධානියා

06. දෙමාපියන්/ නීත්‍යානුකූල භාරකරුවන් විසින් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී උපලේඛණයෙහි සඳහන් නිර්නායකයන්ට අනුව තමන්ට හිමි විය යුතු ලකුණු සංඛ්‍යාව අදාළ කොටුවල සඳහන් කළ යුතුයි.

07. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ලකුණු නිවැරදි බව අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අදාළ ලිපි ලේඛනයන්හි මුල් පිටපත් පරීක්ෂා කර බලා සනාථ කර ගත යුතුයි.

08. පුරප්පාඩුවලට අනුව ඇතුළත් කිරීමට සුදුසුකම් ලබන දරුවන් අයදුම් පත්‍රයේ තමන් සඳහන් කර ඇති අදාළ පදිංචි ස්ථානයේ ම පදිංචිව සිටි ද යන්න සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පරීක්ෂා කර බලා තහවුරු කර ගත යුතුය.

09. යම් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය බව ඔප්පු වුවහොත් එම අයදුම්කරු ලේඛනයෙන් ඉවත් කර ඒ වෙනුවට ඊලගට වැඩි ලකුණු ලබා ඇති අයදුම්කරුගේ දරුවා තෝරා ගත යුතුය.

10. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයෙන් පාසලේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලබන දරුවන් පිළිබඳ තොරතුරු ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමාණය ද සමග පාසල් දැන්වීම් පුවරුවේ දෙසතියක කාලයක් ප්‍රදර්ශනය කළ යුතුය. ප්‍රදර්ශනය කෙරෙන ලේඛනයේ සඳහන් පරිදි තෝරාගන්නා ලද දරුවන් පිළිබඳව යම් විරෝධතාවක් වුවහොත් ලේඛණය ප්‍රසිද්ධ කරන ලද දින සිට දෙසතියක් ඇතුළත ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත අභියාචනාවක් ඉදිරිපත් කළ හැකිය.

11. පාසලේ පවතින පුරප්පාඩු අනුව තෝරා ගැනීමට සුදුසුකම් ලබන සිසුන්ගේ නාම ලේඛණය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියළු ම සාමාජිකයින්ගේ අත්සන් සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් අධ්‍යක්ෂකගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. එම ලේඛනය සමග සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වු අපේක්ෂකයන් ලබාගත් ලකුණු පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුය.

**12. 6 ශ්‍රේණියට ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන අවම ලකුණු තීරණය වූ පාසල් වල 5 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම කිසිසේත්ම නොකළ යුතුය.**

13. තෝරා ගැනිමේ නිර්නායක හා ලකුණු ක්‍රමය :-

i. පෞද්ගලික වාසස්ථානයෙන් බැහැරව වාසය කිරීමට සිදු වන පාර්ලිමේන්තුවට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන් පාසලේ පුරප්පාඩු තිබේ නම් ඇතුළත් කර ගත යුතුය.

ii. ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ පදිංචියට පැමිණි නිලධරයන්ගේ දරුවන් හා සැබැවින් ම පාසල පිහිටි ප්‍රදේශයට තම පදිංචිය වෙනස් කළ වෙනත් අයගේ දරුවන් තෝරා ගැනීමේ දී උපලේඛණයේ සඳහන් නිර්නායක හා ලකුණු ක්‍රමය අනුගමනය කළ යුතුය.

14. ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇත. ඒ පිළිබඳව 2004/18 චක්‍රලේඛයේ 21.0 හි සඳහන් පරිදි කටයුතු කළයුතු බවද අවධාරණය කරමි.

ආරියරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

1. විගණකාධිපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. ජාතික අධ්‍යාපන කොමිසමේ සභාපති
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම ශාඛා ප්‍රධානීන්

උපලේඛණය

**ජාතික පාසල්වල 2 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර) පංතිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය**

........................වර්ෂයේදී.................................................................විදුහලේ
........................ශ්‍රේණියට දරුවකු ඇතුළත්කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය

දෙමව්පියන්/ නීත්‍යානුකූල භාරකරු විසින් ආකෘති පත්‍රයේ අංක 01 සිට අංක 06 දක්වා සඳහන් සාමාන්‍ය තොරතුරු ඇතුළත් කොටස් සම්පූර්ණ කළ පසු අංක 07 සිට අංක 13 දක්වා කොටස්වලට ලබා ගත හැකි ලකුණු ප්‍රමාණයන් පිළිබඳ නිර්ණායක සඳහන් කොට ඇත. ඒවා අතුරින් තමන්ට අදාළ නිර්නායක ඉදිරියේ ඇති කොටුව මත √ ලකුණ සටහන් කරන්න. ලකුණු කර ඇති නිර්ණායකයට හිමි ලකුණු ප්‍රමාණය ඉදිරියෙහි ඇති ලකුණු සඳහන් කරන කොටුවේ සඳහන් කරන්න.
(සඳහන් කර ඇති ලකුණු සම්මුඛ පරීක්ෂණ අවස්ථාවෙහි අදාළ ලිපි ලේඛන වලින් සනාථ කළ යුතුයි).

01. පදිංචිය වෙනස් වීම මත දරුවාට පාසලක් ඉල්ලුම් කරන සිසුවාගේ මව/ පියා/ නීත්‍යානුකූල භාරකරුගේ නම :-

.............................................................................................................................

02. පාසල ඉල්ලා සිටින සිසුවාගේ නම :-

- i. උපන් දිනය : අවු............ මාස ............ දින ..........
- ii. ස්ත්‍රී පුරුෂ භාවය :-
- iii. ඉගෙනුම ලබන මාධ්‍ය :-
- iv. ආගම :-

03. ඇතුළත්වීමට බලාපොරොත්තුවන පංතිය :-

.............................................................................................................................

04. පදිංචිය වෙනස් කිරීමට පෙර ඉගෙනුම ලැබූ පාසලේ නම හා ලිපිනය :-

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

05. නව පදිංචි ස්ථානයේ ලිපිනය :-

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

06. පදිංචිය වෙනස්වීමේ ස්වභාවය

ලකුණු

- i. සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණෙන රජයේ නිලධාරීන්/සංස්ථා නිලධාරීන්/ රාජ්‍ය බැංකු නිලධාරීන් (ලකුණු 20) ☐
  (මෙයට රජයේ අවශ්‍යතාවය මත කලත්‍රයා හා දරුවා සමග විදේශ ගතව සිට නැවත මෙරටට පැමිණෙන නිලධරයන් ද සලකනු ලැබේ.)
- ii. පෞද්ගලික අවශ්‍යතා මත ස්ථාන මාරු ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණෙන රජයේ නිලධාරීන්/ සංස්ථා නිලධාරීන්/ රජයේ බැංකු නිලධාරීන් (ලකුණු 10) ☐
- iii. ඉහත i හා ii ට අදාළ නොවන විදේශයන්හි දෙවසරකට වැඩි කාලයක් කලත්‍රයා හා දරුවා සමග පදිංචිව සිට පැමිණෙන ශ්‍රී ලාංකිකයන් හා පාසල පිහිටි ප්‍රදේශයට සැබවින්ම තම ස්ථිර වාසස්ථානය වෙනස් කර පැමිණෙන දෙමාපියන්/නීත්‍යානුකූල භාරකරුවන් (ලකුණු 05) ☐ ☐

07. කලත්‍රයා ද ඉහත 6 හි I හෝ II ට අයත්වන්නේ නම් එම ලකුණු ප්‍රමාණය ඔහුට/ ඇයට ද හිමි වේ. ☐

08. රජයේ අවශ්‍යතා මත ස්ථාන මාරුවීමක් ලබා ඇති නම්, ඔබේ සේවය අලුත් සේවා ස්ථානයට ඇති බලපෑම ☐

- i. අත්‍යාවශ්‍යය (ලකුණු 20) ☐
- ii. අවශ්‍යය (ලකුණු 08) ☐

(නව ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතුයි.)

09. කලත්‍රයා ඉහත 06 හි i ට අදාළ නම් 08 හි i හෝ ii ට අදාළ ලකුණු ලබා දිය යුතුය. ☐

(ඉහත 06, 07, 08 හා 09 ට අදාළවන කරුණු නව ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතුයි.)

10. පෙර පදිංචි ස්ථානයේ සිට නව ස්ථානයට ඇති දුර ප්‍රමාණය ☐

- i. කි.මී .50 - කි.මී 100 (ලකුණු 04) ☐
- ii. කි.මී. 100 - කි.මී 200. (ලකුණු 06) ☐
- iii. කි.මී. 200 ට වැඩි (ලකුණු 08) ☐

11. නව පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර ප්‍රමාණය ☐

- i. කි.මී. 1 ට අඩු නම් (ලකුණු 10) ☐
- ii. කි.මී. 1ට වැඩි කි.මී. 3 ට අඩු (ලකුණු 08) ☐
- iii. කි.මී. 3ට වැඩි කි.මී. 6 ට අඩු (ලකුණු 06) ☐
- iv. කි.මී. 6 ට වැඩි කි.මී. 10 ට අඩු (ලකුණු 04) ☐
- v. කි.මී. 10 ට වැඩි (ලකුණු 02) ☐

12. ඉල්ලුම්කරන පාසලට සිසුවාට ඇති සම්බන්ධතාව ☐

- i. මීට පෙර එම පාසලේ ඉගෙනුම ලබා ඇති නම් (ලකුණු 10) ☐
- ii. දැනට එම සිසුවාගේ සහෝදර/ සහෝදරියන් එම පාසලේ ඉගෙනුම ලබන්නේ නම් (ලකුණු 05) ☐

13. ඉහත අංක 12 සඳහන් කවුරු හෝ (දරුවා/සහෝදර, සහෝදරියන්) එම පාසලට කීර්තියක් ලබා දී ඇති නම් (ලකුණු 03) ☐

14. ප්‍රකාශය :

ඉහත සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බව ද, එම තොරතුරු තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛණ සත්‍ය බව ද සහතික කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. ළමයා පාසලට ඇතුළත් කළ පසු එම තොරතුරු අසත්‍ය බව හෙළිවුවහොත් ඔහු/ඇය පාසලෙන් ඉවත්කර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නම් කෙරෙන ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

.................................................................................................

මවගේ/පියාගේ/නිත්‍යනුකූල භාරකරුගේ අත්සන

දිනය :.........................................................